**ශීර්ෂය 224 - ශ්‍රී ලංකා ගුවන් හමුදාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 224 - ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූලි 21 දින ගුවන් හමුදාපති වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දිමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

------------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

------------------------------

ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 53,653.75 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 35,460.17 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 18,193.58 ක් හෙවත් සියයට 33.9 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 33,994.75 | 31,059.02 | 2,935.73 | 8.64 |
| මූලධන | 19,659.00 | 4,401.15 | 15,257.85 | 77.61 |
| **එකතුව** | **53,653.75** | **35,460.17** | **18,193.58** | **33.9** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත අමාත්‍යාංශ 03 ක් හා දෙපාර්තමේන්තු 04 ක් විසින් එකතුව රු. මිලියන 967.95 ක ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඉන් රු.මිලියන 925.77 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබාදී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 42.18 ක් හෙවත් සියයට 4.36 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 ආදායම් ගිණුම

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් 2016 වර්ෂය සඳහා 20.03.02.16 දරන ආදායම් සංකේතය සඳහා රු.මිලියන 170.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ඇස්තමේන්තු කළ ආදායම රු.මිලියන 193.75 කින් හෙවත් සියයට 13.97 කින් ඉක්මවා ආදායම් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ඇස්තමේන්තුගත ආදායම | සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව ඉක්මවීම | ඉක්මවීම සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 255.00 | 170.00 | 193.76 | 23.75 | 13.97 |

## 2.3 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අදාළ විෂය අංක 22401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 550.00 | 387.36 | 460.00 | 465.14 | 1,000.00 | 269.74 |

## 2.4 අග්‍රිම ගිණුම

ශ්‍රී ලංකා ගුවන් හමුදාව යටතේ වූ අංක 7002/0000/00/0030/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 3.05 ක් විය.

## 2.5 පොදු තැන්පත් ගිණුම්

ශ්‍රී ලංකා ගුවන් හමුදාව යටතේ වන තැන්පත් ගිණුම් 4 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 24.02 ක් විය. විස්තර පහත දැක්වේ.

| පොදු තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0013/0097/000 | 17.67 |
| 6000/0000/00/0002/0065/000 | 1.13 |
| 6000/0000/00/0018/0021/000 | 4.31 |
| 6000/0000/00/0020/0001/000 | 0.91 |
| **එකතුව** | **24.02** |

## 2.6 විගණන නිරීක්ෂණය

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් වන විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් වන විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---------------------------------------------

### 3.1 විසර්ජන ගිණුම

-----------------

#### 3.1.1 අයවැය විචලනය

------------------

සමාලෝචිත වර්ෂයට අදාළව වැය විෂයයන් 43 කට අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා උපයෝජනයන් කළ පසු ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි. 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 224-1-3-2502(12) හා (17) යන වැය විෂයයන් යටතේ එකතුව රු.මිලියන 13,250 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, එම මුළු ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. 2016 වර්ෂයේ රුසියානු ණය යෝජනා ක්‍රමය යටතේ ඉදිකිරීමට යෝජිතව තිබුණු පිරිවැඩියා මධ්‍යස්ථානය සඳහා රු.මිලියන 1,400 ක ප්‍රතිපාදන ඉල්ලුම් කර තිබුණත්, ඒ සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් රු.මිලියන 13,250 ක ප්‍රතිපාදන එම වැය විෂයයන් යටතේ සලසා තිබුණු බව ගුවන් හමුදාපතිවරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි.

### 3.2 පොදු තැන්පත් ගිණුම

-------------------------

තැන්පත් ගිණුම් දෙකක වර්ෂ 2 කට වැඩි කාලයක සිට පැවැත එන එකතුව රු.99,998 ක් වූ තැන්පත් ශේෂ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 3.3 ආදායම් ගිණුම්

----------------

ගුවන් හමුදාපතිවරයා ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් 20.03.02.16 දරන ගුවන් යානා කුළී ආදායම් ගිණුම සම්බන්ධයෙන් ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවරී තිබුණි. එම ආදායම් සංකේතයට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු.මිලියන 13.47 ක් ආදායම් හිඟ හිට තිබුණු අතර , එම හිඟහිටි ආදායම වර්ෂ 01 ක සිට වර්ෂ 15 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණි. හිඟහිටි ආදායම් අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙනුවෙන් ගුවන්යානා කුලියට දීමෙන් ලැබෙන ආදායම් රැස් කිරීමට අදාළ ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් ගුවන් හමුදාපතිවරයා කටයුතු කළ යුතුය. කෙසේ වෙතත් ඔහුගේ සෘජු අධීක්ෂණය යටතේ මෙහෙයුම් කටයුතු සිදු කරනු වෙනුවට පෞද්ගලික සමාගමක් විසින් සමාගම නමින් නිකුත් කළ ලදු පොත් භාවිතා කර ගුවන්යානා කුලියට දීමෙන් ආදායම් රැස් කර තිබුණි. එසේ රැස් කරන ලද ආදායම් ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත ප්‍රේෂණය කිරීමට දිගු කාලයක් ගතවී තිබුණි.

## 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

----------------------------------------

විගණනය සඳහා ඉදිරිපත් කළ විෂය අංක 22401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.20,592,838 ක් වී තිබුණි. වර්ෂ 1 ක සිට වර්ෂ 5 ක් දක්වා කාලයක සිට පැවැත එමින් තිබුණු එකතුව රු.11,473,624 ක ශේෂ හා වර්ෂ 5 කට වැඩි කාලයක සිට පැවැත එමින් තිබුණු එකතුව රු.9,119,214 ක් වූ හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

## 3.5 වත්කම් කළමනාකරණය

---------------------------

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) වත්කම් පාලනය

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 ජුනි 05 දිනැති අංක PCMD/RP/2013 දරන ජනාධිපති ලේකම්ගේ ලිපිය ප්‍රකාරව රාජ්‍ය ආයතනවල ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින පැරණි වාහන හා යන්ත්‍රෝපකරණ ආදිය ඉදිරි මාස 3 ක් තුළදී අපහරණය කිරීමට හෝ වෙන්දේසි කිරීමට හෝ මුදල් රෙගුලාසි ප්‍රකාරව අපහරණ ක්‍රියාවලියට අනුකූලව ඔරුවල වානේ සංස්ථාවට භාරදීමට කටයුතු කළ යුතු බව සඳහන් කර තිබුණි. නමුත් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් භාවිතයට ගැනීමට නොහැකි අපහරණය සඳහා භාරදුන් වාහන 67 ක් කටුනායක සැපයුම් හා නඩත්තු අංශය තුළ 2017 මැයි 31 දින වන විට වර්ෂ හතරකට වැඩි කාලයක සිට දිරාපත් වෙමින් පැවතුණි. තවද අළුත්වැඩියා කළ හැකි වාහන 79 ක් කටුනායක හා වවුනියා යන්ත්‍ර ප්‍රවාහන අලුත්වැඩියා කිරීම් හා නඩත්තු කිරීම් අංශය තුළ රඳවාගෙන තිබුණි.

(ii) කටුනායක ගුවන් හමුදා කඳවුරේ සැපයුම් හා නඩත්තු අංශයේ රෙදි පිළි ගබඩාවේ උපරිම තොග මට්ටම ඉක්මවූ රු.75,088,113 ක් වටිනා රෙදිපිළි තොගයක් ප්‍රයෝජනයට නොගෙන වර්ෂ 1 ක සිට වර්ෂ 2 ක කාල පරාසයක් අතර ගබඩා කර තිබුණි.

### (ආ) බේරුම් නොකළ බැරකම්

--------------------------

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් 2016 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.765,498,905 ක් වූ අතර, ඒ පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(i) 2016 දෙසැම්බර් 31 දිනට ගුවන්යානා අමතර කොටස් හා වෙනත් මිලදී ගැනීම් වෙනුවෙන් ගෙවිය යුතුව පැවති රු.මිලියන 3,241.36 ක් බැරකම් ලේඛණයේ සටහන් කර නොතිබුණි.

(ii) වැය විෂයන් 20 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.මිලියන 223.85 ක් බැරකම්වලට බැඳී තිබුණි.

**3.6 අනුකූල නොවීම්**

**-----------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**---------------------------------------------**

වැය විෂයයන් 29 කට අදාළව භාණ්ඩ ලබා ගැනීම සඳහා රු.99,424,634 ක් වැය කර තිබුණත්, මුදල් රෙගුලාසි 237 ට පටහැනිව අදාළ භාණ්ඩ ලබා ගැනීමට පෙර එම ගෙවීම් වවුචරය සහතික කර ගෙවීම් කර තිබුණි.

**3.7 කාර්යසාධනය**

**----------------**

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරි සැලැස්ම අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

**--------------------------------------------**

ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු භෞතික හා මානව සම්පත් මෙන්ම අරමුදල් උපයෝගී කර ගනිමින් ගුවන් හමුදාව සතු පෞද්ගලික ආයතනයක් වශයෙන් පවත්වාගෙන යනු ලබන හෙලිටුවර්ස් සමාගම 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වර්ෂ 7 ක කාලයක් තුළ රු. මිලියන 43.7 ක ලාභයක් ලබා තිබුණත්, ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සිදු කළ ආයෝජනයට ප්‍රතිලාභ වශයෙන් ලාභාංශ රජයේ ආදායමට බැර කර නොතිබුණි.

**(ආ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

**--------------------------------------------------**

වවුනියාව ගුවන් හමුදා මූලික කඳවුරේ 2එම්ටීආර් සහ ඕඩබ්ලිව් ඒකකය මගින් මෝටර් වාහන නඩත්තු කිරීම්, නවීකරණය හා අළුත්වැඩියා කර නැවත සකස් කිරීම සිදු කරනු ලබයි.

මෙම ඒකකය ස්ථාපනය කර වර්ෂ 2 කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණු අතර 2016 දෙසැම්බර් 02 දින වන විට අළුත්වැඩියාව සඳහා මෝටර් වාහන 55 ක් ලැබී තිබුණි. ඉන් මෝටර් වාහන 19 ක් පමණක් අළුත්වැඩියා කටයුතු නිම කර ආපසු භාර දී තිබුණු බව නිරීක්ෂණය විය. එසේම මෙහි කටයුතු ක්‍රමානුකූලව හා කාර්යක්ෂමව පවත්වා ගෙනයාමට අවශ්‍ය වන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 33 ක් පැවති බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් මෝටර් වාහන එන්ජින් 10 ක් අළුත්වැඩියා කිරීමේ කටයුතු රු.4,739,060 ක පිරිවැයකට පෞද්ගලික ආයතනයක් වෙත 2016 ජුනි 05 දින පවරා තිබුණි.

**(ඇ) අභ්‍යන්තර අරමුදල් පවත්වාගෙන යාම**

**------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2011 නොවැම්බර් 30 දිනැති අංක 852 දරන ගුවන් හමුදාපතිගේ ගුවන් හමුදා නියෝගයේ අංක 5 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ විවිධ කඳවුරු හා ඒකකවල අභ්‍යන්තර අරමුදල් 97 ක් ආරම්භ කර තිබුණි. මෙම අරමුදල්වල මෙහෙයුම් කටයුතු සඳහා සහ අරමුදල් මගින් කරනු ලබන ලාභ උපයන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු භෞතික හා මානව සම්පත් උපයෝගී කරගෙන තිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149(අ) ව්‍යවස්ථාව අනුව කිසියම් ලිඛිත නීතියක් යටතේ දක්වා නොමැති ජනරජයට ලැබෙන සියළු ලැබීම්

ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත්, එම අරමුදල් මගින් උත්පාදනය කරන ආදායම රාජ්‍ය ආදායමට එකතු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2016 ජුලි 29 දිනැති අංක 7/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වන ව්‍යවස්ථාව හා 2015 සැප්තැම්බර් 21 දිනැති අංක 1933/15-2015 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් දක්වා ඇති පරිදි අරමුදල් සමාලෝචනය කර චක්‍රලේඛය මගින් ඉදිරිපත් කර ඇති ආකෘතියට අනුව එය නිකුත් කළ දින සිට දින 14 ක් ඇතුළත රාජ්‍ය මුදල් අධ්‍යක්ෂක ජනරාල් වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණි. ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් 97 ක් පවත්වාගෙන යන නමුත් එයින් ව්‍යවස්ථාපිත අරමුදල් 7 ක තොරතුරු පමණක් 2016 සැප්තැම්බර් 02 දින ඉදිරිපත් කර තිබුණි. අනෙක් අරමුදල් පිළිබඳ තොරතුරු 2017 ජූනි 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

## 3.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් 2016 වර්ෂයේදී විවිධ ඉදිකිරීම් සඳහා ගුවන් හමුදාවේ කර්මාන්ත ව්‍යාපෘතිවලින් කළුගල් කියුබ් 13,641 ක් සහ වැලි කියුබ් 5,475 ක් සපයා තිබුණි. නමුත් එම ව්‍යාපෘති සඳහා කර තිබුණු වියදම් සහ එමගින් ලැබෙන ආදායම් විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

## 3.9 අවිධිමත් ගනුදෙනු

--------------------

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරව සිදු කර තිබුණු බව නිරීක්ෂණය විය. එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

-----------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රත්මලාන ගුවන් හමුදා කඳවුර සඳහා රු.3,169,622 ක් වටිනා සැකසූ කොන්ක්‍රීට් කියුබික් 187 ක් මිලදී ගැනීමේදී ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන් 07 ක් ඇතුළු සැපයුම්කරුවන් 87 කින් ලංසු කැඳවා තිබුණි. එම ලංසුකරුවන් අතරින් කොන්ක්‍රීට් මිශ්‍රණ සැපයුම් නොකරන ආයතනවලින්ද ලංසු කැඳවා තිබුණු බව නිරීක්ෂණය විය. එම ලංසුකරුවන් අතරින් ප්‍රතිචාර දක්වා තිබුණු එකම සැපයුම්කරු වෙත ලංසුව පිරිනමා තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 6.2.2 මාර්ගෝපදේශය පරිදි ලංසු කැඳවීම සඳහා දින 21 ක අවම කාලයක් ලබා දී නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු ගුවන් යානයක එන්ජිම අලුත්වැඩියාව සඳහා රු.10,931,111 ක් වැය කර තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12.1 මාර්ගෝපදේශය ප්‍රකාරව එලදායී තරගකාරී බව නොමැති විට ලංසු ප්‍රතික්ෂේප කළ හැකි වුවත්, එම අළුත්වැඩියාව සඳහා ලංසු ඉදිරිපත් කර තිබුණු එකම සැපයුම්කරු වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. තවද එම මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 මාර්ගෝපදේශය ප්‍රකාරව සීමිත ජාත්‍යාන්තර ලංසු කැඳවීමේදී අවම දින 42 ක කාලයක් ලබා දිය යුතු වුවත්, එසේ කටයුතු කර නොතිබුණි.

(iii) වව්නියාව ගුවන් හමුදා මූලික කඳවුරේ ගුවන් භට ආහාර ගබඩාවේ ශීතාගාරයේ අළුත්වැඩියාව සඳහා 2016 ජුනි 18 දින රු.125,000 කට වායු සම්පීඩක යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණු අතර එය ස්ථාපිත කර පැය කීහිපයකට පසු ක්‍රියා විරහිත වී තිබුණි. එම යන්ත්‍රය වෙනුවෙන් වගකීම් සහතිකයක් ලබාගෙන නොතිබුණි. මේ හේතුවෙන් 2016 පෙබරවාරි මාසයේ සිට 2017 ජුනි 31 දින දක්වා ශීතාගාරය නිෂ්ක්‍රීය වත්කමක් ලෙස පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

**3.10 පාඩු හා හානි**

---------------

සිද්ධීන් 70 ක් සම්බන්ධයෙන් වර්ෂ 5 කට වඩා වැඩි කාලයක සිට පැවත එන එකතුව රු.මිලියන 30.39 ක් වූ හානි හා පාඩු අයකර ගැනීමට , කපා හැරීමට හෝ අත්හැර දැමීමට ශ්‍රී ලංකා ගුවන් හමුදාව 2016 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.11 අනාර්ථික ගනුදෙනු**

-------------------

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් 2009 වර්ෂයේදී පෞද්ගලික සමාගම් දෙකකින් රු.19,961,000 ක් වටිනා සූර්යබල වීථි පහන් 187 ක් වර්ෂ 15 ක වගකීම් කාලයකට යටත්ව මිලදී ගැනීමට 2009 මැයි මාසයේදී ගිවිසුම් අත්සන් කර තිබුණි. ඒ අනුව 2009 වර්ෂයේදී සවිකර තිබුණු වීථි පහන් සහ බැටරි අතරින් රු.16,024,000 ක් වටිනා වීථි පහන් 148 ක් සහ බැටරි 33 ක් 2015 අප්‍රේල් 20 දින වන විට ක්‍රියා විරහිත වී තිබුණු අතර ඒ අනුව රු.19,961,000 ක අලාභයක් සිදුව තිබුණි. මේ පිළිබඳව පසුගිය වර්ෂයේ විගණනයේදී පෙන්වා දී තිබුණද එහිදී මේ සම්බන්ධව නීතිමය පියවර ගන්නා බව දන්වා තිබුණි. එසේ වුවද 2017 ජුනි 03 දින වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.

**3.12 මානව සම්පත් කළමනාකරණය**

--------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

-----------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | **සිවිල් අංශය** | | | |
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 07 | 04 | 03 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 04 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 193 | 85 | 108 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 3,340 | 2,684 | 656 |
| (v) | අනෙකුත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 430 | 100 | 330 |

| | | | | |
|---|---|---|---|---|
| | **සේවා අංශය** | | | |
| | **--------------** | | | |
| (vi) | නිලධාරීන් | 2,156 | 1,784 | 372 |
| (vii) | සෙසු නිලයන් | 35,844 | 34,534 | 1,310 |
| | | --------- | --------- | --------- |
| | **එකතුව** | **41,975** | **39,195** | **2,780** |
| | | **====** | **====** | **====** |